**ශීර්ෂය 304 කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව**

---------------------------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පින්ඩන වාර්තාව 2023 මැයි 10 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 මැයි 22 දින ගණන්දීමේ නිළධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය නොවන වත්කම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුව විසින් ගොන්ගල රේඩාර් පද්ධතියක් ස්ථාපනය කිරීම සඳහා රු. මිලියන 402.8ක් වැය කර වර්ෂ 13 ක් ගතවී තිබුනද එම කාර්යය මේ දක්වා නිමකර නොතිබුණි. මෙම මූලධන වියදම මූල්‍ය ප්‍රකාශන තුලින්ද අනාවරණය කර නොතිබුණි. | ඩොප්ලර් රේඩාර් පද්ධතියට අදාළ වත්කම් ඉන්වෙන්ට්‍රිගත කිරීමට අදාළ ලේඛන සොයා ගැනීමට අපොහොසත් විය. තවද 2016.12.31 ට පෙර මිලදී ගත් වත්කම් අගය කිරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්තුමා විසින් පත් කරන ලද කමිටුව විසින් 2020.12.31 දින වන විට ලබා දුන් වාර්තා වල ඩොප්ලර් රේඩාර් පද්ධතියට අදාළ වත්කම් ඇතුළත් වී නොමැත. එබැවින් ඉන්වෙන්ට්‍රි ගතනොවූ භාණ්ඩ සඳහා කපා හැරීමක් සිදු කළ නොහැක. | මෙම වත්කම් නිසි පරිදි තක්සේරු කර මූල්‍ය ප්‍රකාශවල අනාවරණය කළ යුතු වීම. |

### 1.6.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව දෙපාර්තමේන්තුව විසින් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | ප්‍රධාන ගණකාධිකාරීතුමාගේ පූර්ණ අධීක්ෂණය යටතේ ස්ථාවර වත්කම් ලේඛණය සකස් කිරීම සඳහා ගොඩනැගිලි, වාහන සම්බන්ධයෙන් තොරතුරු ඇතුළත් කර යාවත්කාලීන කිරීම සඳහා ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. | චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනය පවත්වා ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය සඳහා සියළු ගැලපීම් කිරීමෙන් පසු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 791.7 ක් වූ අතර මුළු වියදම රු.මිලියන 369.2 ක් වූ බැවින් ඉතිරිය රු.මිලියන 422.5 ක් විය.ඒ අනුව සියයට 53 ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. | චක්‍රලේඛ අංක 03/2022 අනුව වියදම් සීමා කිරීම, බලාපොරොත්තු වූ පරිදි වියදම් උද්ගත නොවීම, පවතින ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම, ගෝලීය ව්‍යසනයන් හා ප්‍රදාන ප්‍රමාණය ප්‍රමාණවත් නොවීම හේතුවෙන් ව්‍යාපෘතිය ප්‍රමාද වීම මෙම ප්‍රතිපාදන ඉතිරිවීම් වලට හේතු ලෙස ඉදිරිපත් කර තිබුණි. | භාණ්ඩාගාර ප්‍රතිපාදන නිසි පරිදි කළමනාකරණය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මූලධන වැය විෂයයන් 03 ක් සඳහා වෙන් කරන ලද රු. මිලියන 377.5 ක් මුළු ප්‍රතිපාදනය සහ මූලධන වැය විෂයයන් 04 ක සියයට 39 සිට 91 දක්වා පරාසයකද ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. | බලාපොරොත්තු වූ පරිදි වියදම් උද්ගත නොවීම නිසා ප්‍රතිපාදන ඉතිරිවිය. | -එම- |

**2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වැය විෂයයන් 03 කට අදාල රු.1,550,042 ක බැරකම් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කර නොතිබුණි. | අත්වැරදීමකින් 1402 වැය විෂයය යටතේ රු. 824,398 ක හා රු. 46,870 ක බැරකම් ද 1403 වැය විෂයය යටතේ රු. 607,024 ක හා රු. 8,474 ක බැරකම් ද මූල්‍ය ප්‍රකාශනය තුල ඇතුළත් නොවී ඇති අතර අනෙකුත් බැරකම්, මූල්‍ය ප්‍රකාශන මුද්‍රණය කිරීමෙන් අනතුරුව ගෙවීම් සඳහා ඉදිරිපත් වූ ඒවා වේ. ඉදිරියේදී මෙවැනි අත්වැරදීම් සිදුනොවීමට වගබලා ගනිමි. | වර්ෂයට අදාල සියළුම බැරකම් මූල්‍ය ප්‍රකාශන වලින් ඉදිරිපත් කළ යුතුය. |

**2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීතිරීති රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(2)(1) උපවගන්තිය | | | |
| | | අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර නොමැති අවස්ථාවකදී මෙම පනත ක්‍රියාත්මක වීමේ දින සිට වර්ෂ 2 ක් නොඉක්මවන කාලසීමාවක් තුල එම පත්කිරීම සිදු කල යුතු වුවද, එම වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මෙම දෙපාර්තමේන්තුව වෙත අනුයුක්ත කළ නිලධාරිනිය 2019.07.01 දින සිට වහාම ක්‍රියාත්මක වන පරිදි අනුප්‍රාප්තිකයෙකු රහිතව ජනාධිපති කාර්යාලයට ස්ථාන මාරුවක් ලබා දී තිබුණි. ඒ අනුව, දෙපාර්තමේන්තු රාජකාරි අවශ්‍යතාව සඳහන් කර නැවතත් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත දිගින් දිගටම සිදු කළ ඉල්ලීම් අනුව 2022.03.22 දින සිට එකී තනතුරේ රාජකාරි වැඩ බැලීම සඳහා (සිය නිත්‍ය තනතුරට අමතරව) ශ්‍රී ලං.ග.සේ. III ශ්‍රේණියේ නිලධාරිණියක් අනුයුක්ත කිරීම සිදුකර ඇති | පනත ප්‍රකාරව අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර ගැනීමට ප්‍රමුඛතාව දී කටයුතු කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | අතර එම කාලසීමාව ද මේ වන විට අවසන්ව ඇත. පුරප්පාඩුව පවතින අභ්‍යන්තර විගණක තනතුරට ස්ථිර වශයෙන් නිලධාරියෙකු පත් කර දෙන ලෙස රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් වෙත 2022.08.25 දිනැතිවද නැවත ඉල්ලීමක් සිදු කර ඇත. එබැවින් දෙපාර්තමේන්තුව මඟින් කළ යුතු කටයුතු සිදු කර ඇත. එබැවින් මෙම දෙපාර්තමේන්තුව සඳහා අභ්‍යන්තර විගණකවරයෙකු පත්කිරීම අපගේ පාලනයෙන් බැහැර කටයුත්තකි. | |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) | මුදල් රෙගුලාසි 272 (3) | ගෙවන ලද සියළුම වවුචර් ඒවාට අදාල මාසය අවසානයේ සිට සති 06 කට නොවැඩි කාලයක් ඉකුත්වීමට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවද, 2022 මැයි මසට අදාල රු.319,358 ක් වටිනාකමැති වවුචර් 04 ක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | විගණනය සඳහා අදාළ මාසයේ වවුචර් රජයේ විගණන අංශයට ලබා දීමෙන් පසු ගිණුම් අංශය වෙත ලැබී ඇත. | ගෙවන ලද සියළුම වවුචර් ඒවාට අදාල මාසය අවසානයේ සිට සති 06 කට නොවැඩි කාලයක් ඉකුත්වීමට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතුය. |
| (ii) | මුදල් රෙගුලාසි 571(3) | අවුරුදු 02 ඉක්මවූ ඇප තැන්පතු මුදල හැර එකතුව රු. 449,279 ක් වූ තැන්පතු අවස්ථාවෝචිත පරිදි අදාළ ගිණුමට හෝ රාජ්‍ය ආදායමට බැර කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම රු.479,279 ක මුදලින් රු 30,000 නිළධාරීන්ගේ ඇප තැන්පත් මුදල් වන අතර ඉතිරි මුදල සම්බන්ධයෙන් අදාළ ගිණුමට හෝ රාජ්‍ය අදායමට බැර කිරිමට කටයුතු කරමි. | තැන්පතු හඳුනාගෙන ඒවා අදාල ගිණුම් වලට ගිණුම්ගත කිරීමට කටයුතු කලයුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (iii) | මුදල් රෙගුලාසි 891(1) | ඇප තැබිය යුතු නිලධාරීන්ගෙන් ඇප තැන්පත් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඇප තැන්පත් කළ යුතු නිලධාරීන් හඳුනාගෙන, ඇප තැන්පත් කිරීමේ කටයුතු ආරම්භ කිරීමට කටයුතු කරනු ලැබේ. | ඇප තැන්පත් ලබාගත යුතු අයගෙන් ඒවා ලබාගැනීමට කටයුතු කල යුතුය. |
| (ඇ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ | | | |
| (i) | 3.4.3 වගන්තිය | වාහන අළුත්වැඩියා කිරීම සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචිකර ගැනීමක් සිදුකර කර නොතිබුණි. | Yellow pages වෙතින් දෙපාර්තමේන්තුවට ආසන්නව ඇති සැපයුම්කරුවන් තෝරා ලියාපදිංචි කර ඇත. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළ යුතුය. |
| (ii) | 4.2.1 වගන්තිය | විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් සකස්කර ඉදිරිපත් කර නොතිබුණි. | ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සඳහා අමාත්‍යාංශ ලේකම්තුමාගේ අනුමැතිය ලබාගෙන ඇති අතර මින් ඉදිරියට විස්තරාත්මක සැලැස්මද සකස් කර අනුමැතියට ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත. | -එම- |
| (iii) | 4.2.1(ඉ) වගන්තිය | ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම මාස 06 කට වැඩි නොවන කාලයක් තුලදී නිතිපතා යාවත්කාලීන කල යුතු වුවත් එසේ සිදුකර නොතිබුණි. | ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම මින් ඉදිරියට මාස 06කට නොවැඩි කාලයක් තුලදී නිතිපතා යාවත්කාලීන කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත. | -එම- |
| (iv) | 6.3.1 “ඇ” වගන්තිය | “ලංසු කරුවන්ට උපදෙස්” යන ලේඛනයේ නියම කරන ලද අයුරු “මුල් පිටපත” හෝ “පිටපත යනුවෙන්” පැහැදිලිව සලකුණු කරන ලද හා වෙනම මුද්‍රා තබන ලද ලංසු එක් මුල් පිටපතකින් හා අවශ්‍ය පිටපත් සංඛ්‍යාවකින් ඉදිරිපත් කල යුතුය. එහෙත් එකතුව රු.3,911,660 ක් වටිනාකමැති ප්‍රසම්පාදන දෙකක | ලංසු ලේඛන වල 21. Format and signing of Bid උදෘතය යටතේ පහතින් සඳහන් කර ඇති ආකාරයට “මුල් පිටපත” හෝ “පිටපත” යනුවෙන් පැහැදිලිව සලකුණු කරන ලද හා වෙනම මුද්‍රා තබන ලද ලංසු එක් මුල් පිටපතකින් හා අවශ්‍ය පිටපත් සංඛ්‍යාවකින් ඉදිරිපත් කල යුතු බව දක්වා ඇත. මේ පිළිබඳව ගොනු වල අමුණා ඇති ලංසු ලේඛන පරීක්ෂා කිරීමෙන් කරුණු සනාථ කරගත හැකිය. | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| | | ලංසු ලේඛනවල ඉහත දැක්වෙන පරිදි උපදෙස් ලබාදී නොතිබුණි. | | |
| (ඇ) | 2014 ඔක්තෝම්බර් 14 දිනැති 2/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා මාර්තු 16 ට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවද, එම චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය, බාහිර කාර්යාල හා AWS මධ්‍යස්ථානවල 2022 වර්ෂයේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කටයුතු සඳහා නියමිත කාලයේ නිලධාරී මණ්ඩල පත්කළ අතර, පසුගිය දිනවල සීමිත ඉන්ධන ප්‍රමාණයක් නිකුත් කිරීම හේතුවෙන් සහ බාහිර කාර්යාල හා AWS මධ්‍යස්ථාන වල සමීක්ෂණ කටයුතු කිරීම සඳහා නිසි වේලාවට ප්‍රවාහන පහසුකම් සපයා ගැනීමේදී ගැටළු මතුවීම හේතුවෙන් භාණ්ඩ සමීක්ෂණ කටයුතු ප්‍රමාද විය.<br>2022 වර්ෂයේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කටයුතු කඩිනමින් නිම කර මෙම මස අවසාන වන විට වාර්තා ලබා ගැනීමට කටයුතු යොදා ඇති බව කාරුණිකව දන්වා සිටිමි. | චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතුය. |
| (ඉ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | | | |
| (i) | 2009 අප්‍රේල් 16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා 2009 අප්‍රේල් 16 දිනැති ලිපියේ iv ඡේදය | වේලාව පදනම් කරගෙන අතිකාල හා නිවාඩු දින වැටුප් ආදී නිත්‍ය රාජකාරි වේලාවෙන් පසුව ගෙවනු ලබන දීමනා සඳහා කාලය පදනම් කර ගන්නේ නම් එම කාලය ඇඟිලි සලකුණු යන්ත්‍ර සටහන් මගින් සනාථ කල යුතු වුවත්, එසේ නොමැතිව 2022 සැප්තැම්බර් වනවිට අමතර රාජකාරි වෙනුවෙන් 1/20 දීමනා ලෙස රු. 10,396,033ක් ගෙවා තිබුණි. | කෘත්‍ය ලේඛනයේ D (දිවා) සේවා මුරය ලෙස 08.00 පැය සිට 16.00 පැය දක්වාත්, N (රාත්‍රී) සේවා මුරය 16.00 පැය සිට පසුදින 08.00 පැය දක්වාත් සැලකේ. මේ වන විට වේලාසටහන් යන්ත්‍රයේ එකම වේලාවේ සේවය නිමකර පිටවීම සහ නැවත පැමිණීම සටහන් කිරීමට පහසුකම නොමැත. වේලාසටහන් යන්ත්‍රය මිලදී ගත් ආයතනය සමඟ සාකච්ඡා කර එම පහසුකම ස්ථාපිත කිරීමට මේ වන විට කටයුතු කරමින් පවතී. තවද ඉදිරියේදී සෑම කාර්යාලයකටම වේලාසටහන් යන්ත්‍ර මිලදී ගැනීමේදී මෙම | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | පහසුකම පිරිවිතර වලට ඇතුළත් කිරීමට බලාපොරොත්තු වන බව කාරුණිකව දන්වා සිටිමි. පැය 16ක රාත්‍රී සේවා මුරයක් පවතින්නේ සීමිත සේවක සංඛ්‍යාවක් ඇති කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ කෘත්‍ය ලේඛණ රාජකාරී කරන නිලධාරීන්ට නිල නිවාස, ප්‍රවාහන පහසුකම් නොමැති බැවින් රාත්‍රී 12ට සේවයට පැමිණීම /පිටවීම ප්‍රායෝගික නොමැති බැවිනි. අදාළ නිලධාරීන් සඳහා 1/20 දීමනාව ගෙවා ඇත්තේ පැය 8ක අඛණ්ඩ සේවා කාලයක් සේවා කරන ලද අමතර සේවා මුර හෝ රජයේ නිවාඩු දිනවල කරන ලද පැය 8ක සේවා මුර සඳහා පමණි. | |
| (ii) | 2006 මැයි 30 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 09/2006 | ආවරණය නොකරන ප්‍රමාදවීම් සහ කෙටි නිවාඩු 02 ක් හැර පෙ.ව. 9.00 න් පසු පැමිණීම් සඳහා නිලධරයාගේ නිවාඩුවලින් (1/2) අඩු කළ යුතු වුවත්, පැමිණීම සම්බන්ධයෙන් කල නියැදි විගණන පරීක්ෂාවේදී කළමනාකරණ සහකාර නිලධාරීන් 11දෙනෙකුගේ අවස්ථා 90කදී සහ සංවර්ධන නිලධාරීන් 05දෙනෙකුගේ අවස්ථා 17කදී එසේ නිවාඩුවලින් අඩු කර නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ වේලාසටහන් යන්ත්‍රයේ පවතින සුළු දෝෂ සහ පසුගිය වසරවල පැමිණීමේදී සිදුවන බාධා තවදුරටත් සළකා 2022 දෙසැම්බර් මාසය දක්වා මෙම දෙපාර්තමේන්තුවේ කණිෂ්ඨ සේවකයින් හැර අනෙකුත් සියළුම නිලධාරීන්ගේ නිවාඩු පරීක්ෂාවේදී පෙ.ව. 9.03 දක්වා සහනයක් ලබා දී ඉන් පසුව ප්‍රමාද වී පැමිණීම් සඳහා නිවාඩු අඩු කිරීමට කටයුතු කරන ලදී. මෙහිදී පෙ.ව. 9.00 සිට පෙ.ව. 9.03 දක්වා කාලය තුළ පැමිණෙන්නන්ගේ පැමිණීම පෙ.ව. 9.00 ලෙස සළකන ලදී. කෙසේ වෙතත් 2023 වර්ෂයේ සිට ආවරණය නොකරන ප්‍රමාදවීම් සම්බන්ධයෙන් නියමිත පරිදි කටයුතු කරන බවත්, ඒ සම්බන්ධයෙන් සියළු නිලධාරීන් දැනුවත් කළ බව කාරුණිකව දැනුම් දෙමි. | - එම - |

## 2.4 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් නිකුත්කිරීම හා පියවීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වර්ෂ 05ක් ඉක්මවූ සේවය හැර ගොස් ඇති සේවකයින්ගෙන් අයවිය යුතු රු.121,830 ක ණය ශේෂය සමාලෝචිත වර්ෂයේදී අයකර ගැනීමට කටයුතු කර නොතිබූ අතර සාමාජික ණය ලේඛණය යාවත්කාලීන කිරීමටද කටයුතු නොතිබුණි. | මෙම සේවය හැර ගිය එම්.එස්.තිලකරත්න මහතාගේ ණය සම්බන්ධයෙන් පහත පරිදි කටයුතු කර ඇත.<br>ණය ශේෂ අයකර ගැනීම සඳහා පී.එම්.එස්. තිලකරත්න මහතාව සම්බන්ධ කර ගැනීමට නොහැකි බැවින් රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020 හි 1 කොටසෙහි 3.1 ඡේදයේ මු.රෙ. 113(6) (ආ) අනුව රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමට අය විය යුතු රු. 121,830ක හිඟ ණය ශේෂය අත්හැරීම සඳහා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා දෙන මෙන් ඉල්ලා සිටි අතර, රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් විසින් මෙම නිලධාරියාගෙන් ණය ශේෂය අය කර ගැනීමට කටයුතු කරන ලෙස දන්වා ඇත. ඒ අනුව නැවතත් මෙම ණය ශේෂය පියවන ලෙස නිලධාරියා වෙත දැනුම් දී ඇති අතර, ඒ සඳහා මේ වන තෙක් ප්‍රතිචාරයක් දක්වා නොමැත. මේ පිළිබඳව<br>නීතිපති දෙපාර්තමේන්තුවෙන් උපදෙස් ලබා දෙන මෙන් ඉල්ලා ඇත. ඒ අනුව නීතිපති දෙපාර්තමේන්තුව සමඟ 2022.11.10 වන දින සාකච්ඡාවක් සිදු කළ අතර, මෙම කරුණ පිළිබඳව වැඩිදුර විස්තර පසුව දැනුම් දෙන බව නීතිපති දෙපාර්තමේන්තුවේ නීතිඥවරයෙකු වාචිකව අප වෙත දැනුම් දෙන ලදී. | හිඟ ණය ශේෂ අයකර ගැනීමේ ක්‍රමවේදය විධිමත් කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දැනුවත් කිරීමේ වැඩසටහන් (304-2-1-13-2509) වෙනුවෙන් රු. මිලියන 1.5 ක ප්‍රතිපාදන වලින් කිසිදු මුදලක් වැයකර නොතිබුණි. | රාජ්‍ය වියදම් පාලනය කිරීම යන මැයෙන් වන 2022/04/26 දිනැති අංක 03/2022 දරණ ජාතික අයවැය චක්‍රලේඛ අනුව අත්‍යවශ්‍ය කාර්යන් සඳහා පමණක් ප්‍රතිපාදන යොදා ගැනීමට සිදු වූ අතර අනෙකුත් කාර්යයන් තාවකාලිකව අත්හිටුවීමට සිදු විය. එම නිසා අපේක්ෂිත මූල්‍ය ඉලක්කයන් වෙත ළඟා වීමට නොහැකි විය. මෙම වැය විෂය | ක්‍රියාකාරී සැලැස්මට අනුව ප්‍රතිපාදන උපයෝජනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | යටතේ ඉහත චක්‍රලේඛය ප්‍රකාරව අත්‍යවශ්‍ය කාර්යයන් පමණක් ඉටු කරමින් වියදම් පාලනය කල බැවින් මූලා ප්‍රගතිය 50% ට වඩා අඩු විය. | |

## 3.2 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පොතුවිල්, අනුරාධපුරය, මඩකලපුව, කටුගස්තොට, මහඉලුප්පල්ලම, මන්නාරම, රත්නපුර, කුරුණෑගල, වව්නියාව, මුලතිව් යන කාලගුණ විද්‍යා ප්‍රාදේශීය කාර්යාල පිහිටි භූමි ප්‍රදේශ 10 ක් දෙපාර්තමේන්තුව වෙත පවරාගැනීමට කටයුතු කර නොතිබුණි. | එම භූමි ප්‍රදේශ පවරා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතින බව කාරුණිකව දන්වා සිටිමි. | දෙපාර්තමේන්තුව පරිහරනය කරන වත්කම් දෙපාර්තමේන්තුව නමින් පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ජපන් ආධාර යටතේ (**JICA**) 2008 වර්ෂයේදී ලැබුණ රු. මිලියන 570 ක් වටිනා ස්වයංක්‍රීය කාලගුණ විද්‍යා පද්ධති 38 මගින්, උෂ්ණත්වය, ආර්ද්‍රතාවය, වර්ෂාපතනය, සුළගේ වේගය හා දිශාව, පීඩනය, සූර්ය විකිරණ ප්‍රමාණය යනාදී පරාමිතීන් මනිනු ලබන උපකරණ පද්ධති අමතර කොටස් සඳහා 2010 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා රු. මිලියන 123 ක වියදම් දරා තිබුණි. මෙම උපකරණ පද්ධතිය ස්ථාපනයට අදාල මිලදීගැනීම් සඳහා විධිමත් අනුමැතීන් සහිත ලිපිගොනු නිසි අයුරින් නඩත්තු කර ප්‍රසම්පාදන අංශයේ නොතිබුණු අතර උපකරණ පද්ධතිවලින් 20 ක් (02 ක් ඉවත් කිරීමට සිදුව ඇත.) කාලගුණ විද්‍යා ප්‍රාදේශීය කාර්යාල පරිශ්‍රය තුලද ඉතිරි 16 වෙනත් ආයතන පරිශ්‍ර තුලද ස්ථාපිත කර ඇත. කාලගුණ විද්‍යා පරිශ්‍රය තුල සවිකර ඇති උපකරණ පද්ධති මගින් පරාමිතින් 7ක්ද, අනිකුත් පරිශ්‍ර තුල සවිකර ඇති පද්ධතීන්වලින් පරාමිතීන් 5 ක්ද මනිනු ලබන බව නිරීක්ෂණය විය. 2022 දෙසැම්බර් 31 වනවිට මෙම පද්ධති 38 න් උප පද්ධතිවල උපකරණ ගණනාවක් අක්‍රීය වී තිබුණි. | 2022.12.31 දිනට ස්වයංක්‍රීය කාලගුණ මධ්‍යස්ථානවල ක්‍රියාකාරිත්වය පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.<br>• **M** වර්ගයේ මධ්‍යස්ථාන 18න් උපපද්ධතිවල පරාමිතින්වන ආර්ද්‍රතාවය 02ක්ද, අනිලමානය 03ක්ද, දත්ත ගබඩාව 02ක්ද, දත්ත ප්‍රදර්ශන තිරය **0**2ක්ද, බැටරි 04ක්ද, දත්ත සන්නිවේදනය 04 ක්ද වශයෙන් අක්‍රීයව පවති.<br>• **C** වර්ගයේ මධ්‍යස්ථාන 18න් (1ක් අක්‍රීයයි) උපපද්ධතිවල පරාමිතින් වන අනිලමානය 07ක්ද, දත්ත ගබඩා 08ක්ද, දත්ත ප්‍රදර්ශන තිරය 08ක්ද, සූර්ය පැනල 01ක්ද, බැටරි11ක්ද, දත්ත සන්නිවේදනය 14ක්ද වශයෙන් උපපද්ධති අක්‍රීයව පවති. | වත්කම් නිසි පරිදි නඩත්තු කර කළමනාකරණය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2022 දෙසැම්බර් 31 දින වන විට බැටරිවල ආයු කාලය අවසන් වීම නිසා ක්‍රියාවිරහිත තත්ත්වයේ පවතින ස්වයංක්‍රීය කාලගුණ විද්‍යා මධ්‍යස්ථාන 14 ක් විය. අදාල පරිදි නඩත්තු කටයුතු සිදු නොවීමෙන් ස්වයංක්‍රීය කාලගුණ විද්‍යා මධ්‍යස්ථානවල කාර්යක්ෂමතාව හා ඵලදායීත්වය සම්බන්ධ ගැටළු පැවති බව නිරීක්ෂණය විය. | බැටරිවල ආයු කාලය අවසන්වීම නිසා ක්‍රියාවිරහිත තත්ත්වයේ පවතින ස්වයංක්‍රීය කාලගුණ විද්‍යා මධ්‍යස්ථාන සඳහා අවශ්‍ය බැටරි ලබා ගැනීමට මේ වන විට ඉල්ලීම් ඉදිරිපත් කර ඇති අතර, එම කාර්යය මාස 02 ක් වැනි කාලයක් ඇතුළත සිදුකර ගැනීමට හැකි වෙතැයි බලාපොරොත්තු වේ. බැටරි සවි නොකර ඒ සඳහා අවශ්‍ය සන්වේදක සවි කිරීම ඵල රහිත බැවින් බැටරි සවි කිරීමෙන් අනතුරුව සන්වේදක සවි කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | ක්‍රියාවිරහිත තත්ත්වයේ පවතින ස්වයංක්‍රීය කාලගුණ විද්‍යා මධ්‍යස්ථාන ක්‍රියාත්මක තත්වයට පත් කල යුතුය. |
| (ඈ) | දිවයින පුරා සාම්ප්‍රදායික වැසි මිනුම් කට්ටල 444 ක් විසිරී පැවතියද, ඒවා මගින් අඛණ්ඩව දත්ත නොලැබෙන වැසි මාපක 45 ක් පවතින බව නිරීක්ෂණය විය. | සම්ප්‍රදායික වර්ෂාමාන කට්ටල 444 දිවයින පුරා විසිරී පවතින අතර, ඒවායේ දත්ත අපහට ලබා දෙන්නේ එම උපකරණ ස්ථානගත කර ඇති රජයේ ආයතන හෝ පුද්ගලික ආයතනවල සේවය කරන පුද්ගලයින් විසින් ස්වේච්ඡාවෙන්ය. අතීතයේ සිටම මෙම වර්ෂාමාන වලින් කිහිපයක දත්ත අපහට නොලැබීම දක්නට ලැබේ. මෙම කටයුත්ත ස්වේච්ඡාවෙන් කරන නිසා අපහට ඒ වෙනුවෙන් දැඩි බලපෑමක් එම ස්වේච්ඡා නිලධාරීන්හට සිදු කළ නොහැක. නමුත් අප වරින් වර සිහිකැඳවීම් ලිපි මඟින් එම ආයතන හෝ පුද්ගලයින් දැනුම්වත් කරනු ලැබේ. කිසිදු මුදලක් නොගෙවා අප උත්සාහ කරන්නේ වර්ෂාමාන 400 කට වැඩියෙන් වත් දත්ත ලබා ගැනීමටයි. මෙය විධිමත්ව අඛණ්ඩව දත්ත ලබා ගැනීමට නම් දෙපාර්තමේන්තුවට විශාල පිරිවැයක් දරන්නට සිදුවේ. | අඛණ්ඩව දත්ත නොලැබෙන වැසි මාපක අඛණ්ඩව දත්ත ලැබෙන පරිදි කටයුතු කල යුතුය. |
| (ඉ) | කැබ් රථයක් 2018 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා ධාවනය කර නොතිබූ අතර වර්ෂ 05 ක් පුරා අළුත්වැඩියාවක් සිදු නොකර ධාවනයෙන් ඉවත්කර තිබුණි. 2022 මාර්තු 10 දින වාහනයේ රියදුරු විසින් මෙම කැබ් රථයේ දිරාපත්වී ඇති කොටස් සාදා දෙන ලෙස ඉල්ලීමක් කර තිබුණු අතර 2022 දෙසැම්බර් 01 දින අළුත්වැඩියා සඳහා මිල ගණන් ලබාගෙන තිබුණි. එහෙත් 2023 මාර්තු 31 වන විටත් මෙහි අළුත්වැඩියා කටයුතු සිදුකර නොතිබුණි. | ලබා ගත් ඇස්තමේන්තු අතරින් අවම මිල ගණන් ලබා දී ඇති ගරාජය තෝරාගෙන ඒ අනුව දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව මාර්ගයෙන් ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් කරන ලදී. එම මිල ගණන් සඳහා අනුමැතිය ලබා දීමට තාක්ෂණ ඇගයීම් කමිටු වාර්තාවක් ප්‍රධාන මූල්‍ය නිලධාරී විමසන ලද නමුත් වාහන අළුත්වැඩියා සඳහා තාක්ෂණ ඇගයීම් කමිටුවක් දෙපාර්තමේන්තුව තුළ පත් කර නොතිබුණි. එහෙත් ආරක්ෂක අමාත්‍යාංශයේ තාක්ෂණ නිලධාරියෙක් | වාහන නිසි පරිදි අළුත්වැඩියා කර ධාවනය සඳහා යොදා ගත යුතුය. |

විසින් මෙම ඇස්තමේන්තුව නිර්දේශ කර තිබුණි. කෙසේවෙතත් 2022 වර්ෂයේ දෙසැම්බර් මස මෙය ඉදිරිපත් කළ අතර, අපහට තාක්ෂණ ඇගයීම් කමිටුවක් පත් කිරීමට ප්‍රමාණවත් කාලයක් නොතිබුණි. ඒ අනුව අළුත්වැඩියාව සිදු නොකරන ලදී.

## 3.3 පාඩු හා හානි

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ගොන්ගල රේඩාර් පද්ධතියක් ස්ථාපනය කිරීමට රැගෙනවිත් තිබුණ උපකරණවලින් රු.මිලියන 9.1 ක් වටිනා උපකරණ අස්ථානගතවී තිබූ අතර ඉදිරිපත්කර තිබූ හානි හා පාඩු ලේඛනයේ එම වටිනාකම රු.මිලියන 8.7ක් ලෙස දක්වා තිබුණි. එමෙන්ම මෙම අස්ථානගතවීමට වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන එකී නිලධාරින්ට එරෙහිව ක්‍රියාමාර්ගගෙන නොතිබුණි. | ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ පැවති විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේ දී ගත් තීරණය මත ඩොප්ලර් රේඩාර් පද්ධතිය ස්ථාපනය කිරීමට ඉදි කළ කුළුණ සහිත ගොඩනැගිල්ල හා එහි ඇති භාණ්ඩ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කිරීමට කමිටුවක් පත් කරන ලදි. එම කමිටුව විසින් 2021.03.10 වන දින ගොන්ගල ප්‍රදේශයේ සිදු කළ ක්ෂේත්‍ර චාරිකාව අතරතුර දී ආරක්ෂක අමාත්‍යාංශ ලේකම්ගේ උපදෙස් මත දැනට පවතින භාණ්ඩ හා කුළුණ සහිත ගොඩනැගිල්ල දැනටමත් එහි නතරව සිටින යුද හමුදා බලධාරීන් වෙත ප්‍රයෝජනය සඳහා තාවකාලිකව පවරා දී ඇත.මෙම අස්ථාන ගත වීමට හා අසාර්ථක ව්‍යාපෘතියට වගකිව යුතු නිලධාරීන් හඳුනා ගැනීම සඳහා 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත යටතේ විමර්ශනයක් සිදු කරමින් පවතී.<br>ගොන්ගල ඩොප්ලර් රේඩාර් කුළුණු පරිශ්‍රයේ තිබූ භාණ්ඩ නැතිවීම සම්බන්ධයෙන් මෙම දෙපාර්තමේන්තුව මඟින් යොමු කරන ලද මු.රෙ. 104(3) ප්‍රාරම්භක වාර්තාව හා මු.රෙ. 104(4) අවසන් වාර්තාවෙහි, නැති වූ භාණ්ඩ සම්බන්ධව දළ තක්සේරුව අනුව රු. 9,147,765/- ක වටිනාකම සඳහන් කර ඇති බව කාරුණිකව දන්වමි.<br>කෙසේ නමුත් හානි හා පාඩු ලේඛනය පරීක්ෂා කිරීමේදී එවකට එහි සටහන් තබන නිලධාරියා විසින් නැති වූ භාණ්ඩ සම්බන්ධව දළ තක්සේරුවෙහි සඳහන් අයිතමයන් අතරින් එක් අයිතමයක් (Three Phase Jinasena Water Pump - රු. 400,000/-) අඩුවෙන් සටහන් කර ඇති | මෙම අස්ථානගත වීමට හා අසාර්ථක ව්‍යාපෘතියට වගකිව යුතු නිලධාරීන් හඳුනා ගැනීම සහ රජයට සිදුවූ අලාභය අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

අතර ඒ අනුව හානි හා පාඩු ලේඛනයේ අලාභය රු. 8,747,765/- ලෙස (රු. 9,147,765 . 00 - රු. 400,000 සඳහන් වී ඇති බව නිරීක්ෂණය වේ.

**3.4** **බැංකු ගිණුම් මෙහෙයවීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 වර්ෂයේ බැංකුවට ඍජුවම තැන්පත් කරන ලද රු169,250ක මුදල ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | තැන්පතු සඳහා අදාළ අංශ දැනුවත් කර ලිපි යවා ඇත. ඍජුවම ගෙවන ලද රු 41,913 න්, රු.900 බැංකුවෙන් චෙක් අගරු ගාස්තු (රු 450+450) ලෙස අය කරගෙන ඇත. නැවත එය දෙපාර්තමේන්තු ගිණුමට බැර කරන ලෙස බැංකුව වෙත ලිපි යවා ඇති අතර මේ වන තෙක් නිරවුල් කොට නැත. මෙම රු 41,913 න් ඉතිරි මුදල ලංකා බැංකුව සිදු කරන ලද ගෙවීමකි. එම වවුචර්පත 2023/04/19 දින වවුචර් අංක **p**23/4/25 යටතේ ගිණුම් ගත කර ඇත. | ලැබීම් තහවුරු නොවූ චෙක්පත් හඳුනාගැනීමට කටයුතු කළ යුතුය. |

**3.5** **වාර්ෂික කාර්යසාධන වාර්තාව**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂිකව කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කල යුතු වුවත්, දෙපාර්තමේන්තුව සමාලෝචිත වර්ෂය සඳහා කාර්යසාධන වාර්තාව පිළියෙල කර නොතිබුණි. | වාර්ෂික කාර්යසාධන වාර්තාව සකස් කරමින් පවතින අතර, සකස් කර අවසන් වූ පසු යොමු කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | චක්‍රලේඛය ප්‍රකාරව කාර්යසාධන වාර්තාව නියමිත දිනට පිළියෙල කිරීමට කටයුතු කල යුතුය. |

**3.6** **ප්‍රසම්පාදනයන්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රු. මිලියන 62.3 ක් වන ප්‍රසම්පාදන කාර්යයන් 19 ක් සැලසුම් කල පරිදි ප්‍රසම්පාදන සැලසුමට අනුව අදාල දිනයන්වලදී අවසන් කිරීමට කටයුතු කර නොතිබුණි. | **BD/CBP/**01/01/04-2022 අංක දරණ ජාතික අයවැය චක්‍රලේඛ 03/2022 යටතේ භාණ්ඩාගාර ලේකම් විසින් රාජ්‍ය වියදම් පාලනය කිරීම යන උද්‍යතය යටතේ සියළුම අමාත්‍යාංශ ලේකම්වරු සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට දැනුම් දුන් පරිදි පහත පියවරයන් ඇඩිව | ප්‍රසම්පාදන සැලසුමට අනුගතව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | අනුගමනය කිරීමට උපදෙස් ලබා දී ඇත. එහි මූලිකවම සඳහන් කර තිබූ පරිදි, **"**ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම**,** වැඩ හෝ භාණ්ඩ මිලදී ගැනීම සඳහා (අයවැය යෝජනා ද ඇතුලත්ව) ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර ඇති/ ආරම්භ කිරීමට නියමිත සියළුම ව්‍යාපෘති තාවකාලිකව අත්හිටුවීම.**"** යන කරුණ පදනම් කරගනිමින් අදාල වර්ෂයේ අත්‍යාවශ්‍ය කාලගුණ විද්‍යා උපකරණ හැරුණු විට අනෙකුත් සියළු මිලදී ගැනීම් අත්හිටුවීමට ක්‍රියාකර ඇත. | |

## 3.7 අනාර්ථික ගනුදෙනු

පහත නිරීක්ෂණයන් කෙරේ.

| | විගණන නිරීක්ෂණය | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ ) | ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාලගුණ විද්‍යා නිරීක්ෂක සන්නිවේදක නිලධාරීන් සඳහා රු.3,000,000 ක් වැයකර පාඨමාලා 03 ක් ලබා දී තිබුණි. පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| (i) | එම පාඨමාලාවට නිලධාරීන් 92 ක් සහභාගි වී තිබූ අතර ඉන් 29 දෙනෙකුගේ පැමිණීම සියයට 80 නොවීම හා 05 දෙනෙකු සහභාගි නොවීම හේතුවෙන් පාඨමාලා නිම කිරීමට නොහැකි වී තිබුණි. සහතිකපත් ලබාගත් නිලධාරීන් පිලිබඳ තොරතුරු නොවූ අතර පෞද්ගලික ලිපිගොනුවට සහතික පත්‍රයේ පිටපතක්ද ඇතුලත්කර නොතිබුණි. පාඨමාලාවට සහභාගී නොවූ නිලධාරීන් සහ පාඨමාලාව නියමිත පරිදි සම්පූර්ණ නොකරන ලද නිලධාරීන් 34 දෙනා සම්බන්ධයෙන් කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබූ අතර ගෙවන ලද පාඨමාලා ගාස්තු ඔවුන්ගෙන් අයකර ගැනීමටද කටයුතු කර නොතිබුණි. | කොවිඩ් - 19 තත්ත්වය යටතේ 2020 වසරේ සහභාගීවීම පිලිබඳ ගැටළු මතුවුවද, පෙර වසර වලදී සහභාගී වූ සියළුම දෙනා විශ්වවිද්‍යාලය මඟින් එම සහතිකය ලබා ගෙන ඇත.2020 වසරේ සහභාගීත්වයේ ගැටළු පැවති බැවින්, විශ්වවිද්‍යාලය මඟින් ඒ පිළිබඳව දෙපාර්තමේන්තුව දැනුවත් කර ඇත. 2022.08.09 දිනැති EB/TRN/CB-DOM ලිපිය මඟින් 80% නොමැති නිලධාරීන්ගෙන් නිදහසට කරුණු විමසා ඇත. මේ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. විශ්වවිද්‍යාලය මඟින් ලබා ගත් සහතිකපත්‍රවල පිටපත් අවශ්‍යනම් පුද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම එම නිලධාරියා විසින් සිදු කළ යුතුය. ඉදිරියේදී උසස්වීම් සඳහා මෙම පාඨමාලාව යොදා ගැනීමට බලාපොරොත්තු වන අතර, එම අවස්ථාවේදී පුද්ගලික ලිපිගොනුවට යොමු කිරීම අනිවාර්ය කිරීමට කටයුතු කරනු ලැබේ. | ආයතනය විසින් ලබාදෙන පාඨමාලාවලට නිලධාරීන් සහභාගිවීම සහ ඒවා නිසිපරිදි සම්පූර්ණ කිරීමට විධිමත් ක්‍රමවේදයක් සකස් කිරීමත්, නියමිත පරිදි සම්පූර්ණ නොකරන ලද නිලධාරීන් සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කිරීමත් කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | ස්වයංක්‍රීය කාලගුණ මධ්‍යස්ථානවල නඩත්තු / අලුත්වැඩියා කටයුතු හා අනෙකුත් විද්‍යුත් උපකරණවල අලුත්වැඩියා කටයුතු වෙනුවෙන් තාක්ෂණ සේවයේ නිලධාරීන් වෙත මෙම පාඨමාලාව පැවැත්වුවද, 2020 වනවිට AWS පද්ධතිවලින් 90% ක් පමණ නිසි අලුත්වැඩියාවන් හා නඩත්තු නොකිරීම් නිසා අක්‍රියව ඇති අතර ස්වයංක්‍රීයව දත්ත ප්‍රධාන කාර්යාලයට වාර්තා වීම ඇන හිට තිබුණි. එසේම රසදිය භාවිතයෙන් තොරව කාලගුණ විද්‍යා නිරීක්ෂණ කටයුතු සිදු කිරීමේ ක්‍රමවේදයකට අනුගත වීමද මෙම පාඨමාලාව පැවැත්වීමේ අරමුණ වුවද, 2022 අවසන් වනවිටත් එකී ක්‍රමවේදයට කාලගුණ විද්‍යා නිරීක්ෂණ කටයුතු අනුගත වී නොතිබීම නිසා මෙම පාඨමාලාව මගින් අපේක්ෂිත ඉලක්කද ඉටුවී නොමැති බව නිරීක්ෂණය වේ. | මෙම පාඨමාලා වලින් ලබාගත් දැනුමද භාවිතා කරමින් තාක්ෂණ සේවා නිලධාරීන් මේ වන විට AWS පද්ධතියේ නඩත්තු කටයුතු ඉටු කරමින් සිටියි. ප්‍රවාහන අපහසුතා හා නිලධාරී හිඟය මෙන්ම මෙම නඩත්තු කටයුතු සඳහා ප්‍රධාන කාර්යාලයේ නිලධාරීන්ම දිවයින පුරා යායුතු වීම වැනි බාධා නිසා නිසි කලට වේලාවට නඩත්තු කටයුතු ඉටු කිරීමේ දැඩි අපහසුතාවයක් පවතී. එසේ වුවද මේ වන විට පවතින සීමිත පහසුකම් යටතේ එම කාර්යය ක්‍රම ක්‍රමයෙන් දියුණු කරගනිමින් කරගෙන යනු ලබන බව දන්වා සිටිමි. | පුහුණු වැඩසටහන් මගින් අපේක්ෂිත ඉලක්ක ළඟා කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ නිලධාරීන් සඳහා අඛණ්ඩව ක්‍රියාත්මක වන අධ්‍යාපන පුහුණු වැඩසටහන් මාලාවේ 2022 වර්ෂයට අදාලව පැවැත්වූ අධ්‍යාපන පුහුණු වැඩසටහන 2022 නොවැම්බර් 09,10 හා 11 දිනවලදී කලා වැව ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ පවත්වා තිබුණි.<br>ධාරිතා සංවර්ධනය හා හැකියා වර්ධනය වෙනුවෙන් 2022 වර්ෂයේ අයවැය ප්‍රතිපාදන ලෙස රු. මිලියන 3.5ක් වෙන්වී තිබුණද, එකී ප්‍රතිපාදන උපයෝගී කර වර්ෂය තුල ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත පුහුණු වැඩසටහන් හා දැනුවත් කිරීම් වැඩසටහන් පිළිබඳව ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. පුහුණු වැඩසටහන් සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරියෙකු නොවූ අතර පුහුණු වැඩසටහන්වලට අදාල ලිපිගොනුවල පුහුණුවට සහභාගී වූ නිලධාරීන්ගේ පැමිණීම, වියදම් සම්බන්ධ තොරතුරු සටහන් , ආයතනය පිලිබඳ තොරතුරු , නේවාසිකව පුහුණුව ලබන නිලධාරීන්ගේ නාම ලේඛනය , පැමිණීම | 2022 වසරේ සිදු කිරීමට නියමිත වැඩ සටහන් සම්බන්ධව යෝජනා අයවැය ප්‍රතිපාදන ඉල්ලීමේදී ඉදිරිපත් කර ඇත. ප්‍රමාණවත් ප්‍රතිපාදන පැවති බැවින් එකී යෝජනා අනුව ඉදිරි කටයුතු කරගෙන යන ලදී. අපගේ අනෙකුත් රාජකාරී වලට බාධාවක් නොවන ලෙස කල යුතු නිසාත් බාහිර පුහුණු ආයතනයක් තුළ (නේවාසික පුහුණුවක් නිසා) කරන නිසාත් කලින් දින නියම කළ නොහැක.<br>මෙවර ප්‍රතිපාදන ඉතා සීමිත බැවින් 2023 වසරට එක් වැඩසටහනක් පමණක් කිරීමට නියමිත බැවින් ක්‍රියාකාරී සැලැස්මක් ඉදිරිපත් නොකෙරේ. | පුහුණු වැඩසටහන්වලට නිලධාරීන්ගේ සහභාගීත්වය විධිමත් කිරීමට කටයුතු කළ යුතු අතර වැඩමුළුවට අදාල සියළු තොරතුරු ලිපිගොනුවට ඇතුලත් කළ යුතුය. |

හා අත්සන් ලේඛන , නේවාසික ගාස්තු පිලිබඳ තොරතුරු තහවුරු නොවුණි. තවද, නිලධාරීන් 03 දෙනෙකු පවත්වා තිබූ වැඩමුළු සඳහා සහභාගී වී නොතිබුණි.

### 3.8 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 වර්ෂයේ නිකුත් කල විගණන විමසුම් 12 කින් 04 ක් සඳහා පිළිතුරු ලබා දී නොතිබුණි. | 2022 වර්ෂයේ මෙම දෙපාර්තමේන්තුව සඳහා විගණන විමසුම් 12 ක් නිකුත් කර ඇති අතර, එම සියලුම විගණන විමසුම් සඳහා පිළිතුරු ලබා දී ඇත. 2023 වර්ෂයේ මේ වන විට විගණන විමසුම් 08 ක් නිකුත් කර ඇති අතර, එම විගණන විමසුම් අතුරින් 04 ක් සඳහා පිළිතුරු ලබා දී නොමැති අතර, එම විගණන විමසුම් සඳහා මේ වන විට පිළිතුරු සකස් කරමින් පවතින බව කාරුණිකව දන්වා සිටිමි. | විගණන විමසුම් සඳහා ලබාදී ඇති කාලය තුල පිළිතුරු ලබාදීමට කටයුතු කළ යුතුය. |

### 3.9 කළමනාකරණ දූර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඩොප්ලර් රේඩාර් පද්ධති පුත්තලම හා පොතුවිල් කාලගුණ මධ්‍යස්ථාන භූමියේ ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා 2019 සිට 2022 වන විට රු. මිලියන 513.78 ක (2022 - රු. මිලියන 376) ප්‍රතිපාදන වෙන්කර තිබුණද, වියදම රු.370,161 ක් පමණක් වී තිබුණි. ගිවිසුම්ගත වී වසර 06 ක් (2017-2021) ගතවී ඇතත් රේඩාර් පද්ධති ඉදිකිරීමේ කටයුතු 2020 වර්ෂය අවසානයේදී අවසන් අදියර වෙත ළඟාවී නොතිබුණි. වර්තමානයේ මිල ගණන් ඉහළ යාම නිසා ප්‍රතිපාදනය ප්‍රමාණවත් නොවීම මත ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි. 2022 මැයි මාසයේදී **JICA** ආයතනය හා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් රේඩාර් පද්ධති 02 ක් වෙනුවට එක් පද්ධතියක් පමණක් ස්ථාපිත කිරීමට එකඟතාවය පලකර ඇති බව | විකල්ප වැඩපිළිවෙළක් සමඟ දැනට ව්‍යාපෘතිය ක්‍රියාත්මක තත්වයේ පවතී. නමුත් දෙපාර්තමේන්තුවට පාලනය කළ නොහැකි හේතු නිසා ව්‍යාපෘතිය තව දුරටත් ප්‍රමාද වෙමින් ඇත.<br>2020 වර්ෂයේ ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කිරීමට නොහැකි වූයේ කොවිඩ් වසංගත තත්වය නිසාය.<br>කාලගුණ විද්‍යා අනාවැකිකරණයේදී ඩොප්ලර් රේඩාර් පද්ධතියක දැඩි අවශ්‍යතාවයක් පවතින බව හා එම පද්ධතිය නොමැතිව කාලගුණ විද්‍යා අනාවැකි හා පුරෝකථන ලබා දී ඇති බවට එකඟ වේ. අවසාන වාක්‍යයේ අග කොටසේ අර්ථය පැහැදිලි නැත. | ව්‍යාපෘතිය ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ආයතනය දැන්වූවද, නිල වශයෙන් දක්වා ඇති බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය. මේ අනුව කාලගුණ විද්‍යා අනාවැකිකරණයේදී ඩොප්ලර් රේඩාර් පද්ධතියක දැඩි අවශ්‍යතාවක් පැවතියද, වර්ෂ 15 කට ආසන්න කාලයක් එම පද්ධතිය නොමැතිව කාලගුණ විද්‍යා අනාවැකි හා පුරෝකථන ලබා දී තිබුණි. | | |
| (ආ) | ප්‍රවාහන පහසුකම් හිමි නිලධාරීන් 05 ක් පිළිබඳව කරන ලද පරීක්ෂාවේදී එක් නිලධාරිණියක් අදාල ප්‍රවාහන දීමනාව හා ඉන්ධන දීමනාව ලෙස 2022 වර්ෂයේ ජනවාරි සිට ජූලි දක්වා රු.611,360 ක් ලබාගෙන තිබුණි. එම නිලධාරියා අදාල කාල පරිච්ඡේදයට අදාලව සේවයට වාර්තා කල යුතු දින 101 කින් සේවයට වාර්තා කර තිබුණේ දින 23 $\frac{1}{2}$ පමණි. | නිලධාරිනියගේ සේවයට පැමිණීම හා අධ්‍යක්ෂ (පාලන) තනතුරට අදාල කාර්යභාරය ඉටුවීම තවදුරටත් අසතුටුදායක මට්ටමක පැවතීම මත 2022.07.20 දින ආරක්ෂක අමාත්‍යාංශයේ දී පැවති විගණන කළමනාකරණ කමිටු රැස්වීමේ දී සාකච්ඡා කළ පරිදි 2022 අගෝස්තු මස සිට නිලධාරිණියට හිමි මාසික ප්‍රවාහන දීමනාව තාවකාලිකව නතර කිරීමට පියවර ගෙන ඇත. නිලධාරිනිය විසින් කළ ඉල්ලීම පරිදි 2016.03.09 දිනැති රා.ප.ච. 05/2016 අනුව මාසික ප්‍රවාහන දීමනා ගෙවීම සම්බන්ධයෙන් ආපදා කළමනාකරණ අමාත්‍යාංශය වෙතින් උපදෙස් ඉල්ලීම ද කර ඇති අතර අමාත්‍යාංශ ලේකම්ගේ උපදෙස් පරිදි නැවත එකී ගෙවීම සිදු කර ඇත. | නිලධාරීන්ගේ පැමිණීම සහ නිවාඩු ලබා ගැනීම විධිමත් කර දීමනා ගෙවිය යුතුවීම හා වැඩිපුර මුදල් ගෙවා ඇත්නම් අයකර ගැනීම |

**4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 “න්‍යාය පත්‍රය” ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කල යුතු අතර තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක කරා ලඟාවීමේ ප්‍රගතිය සියයට 0-49 ලෙස දක්වා තිබුණි. එහෙත් ක්‍රියාත්මක වූ ව්‍යාපෘති, එම ඉලක්ක හා ප්‍රගතිය පිළිබඳ සංඛ්‍යාත්මක අගයන් , අධීක්ෂණය, පසු විපරම සහ සමාලෝචනය පිළිබඳ තොරතුරු | තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා දර්ශක හඳුනාගෙන ඇති අතර ඒ අනුව දෙපාර්තමේන්තුව කටයුතු සිදු කරයි. නමුත් දෙපාර්තමේන්තුව විසින් තිරසර සංවර්ධන අරමුණු ඉලක්ක කරගැනීම සඳහාම ව්‍යාපෘති අරඹා නොමැති අතර, දෙපාර්තමේන්තුවේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති හා වැඩසටහන්, දෙපාර්තමේන්තුව සෘජුව දායක වන තිරසර සංවර්ධන අරමුණු 13, ළඟා කර ගැනීමට දායක වේ. එවැනි ව්‍යාපෘති හා | තිරසර සංවර්ධන ඉලක්ක හඳුනාගෙන එම අරමුණුවලට අදාල කාර්යයන් ඉටු කළ යුතුය. |

| | |
|---|---|
| විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | වැඩසටහන් හඳුනාගෙන ඇත. අදාළ තොරතුරු ඇතුළත් කර ඇත. |

**5. යහපාලනය**

**5.1 වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් නොකිරීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 1 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත හා 1988 අංක 74 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ (සංශෝධන) පනත ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ නිළධාරීන් 86 දෙනෙකුගෙන් 38 දෙනෙකු විසින් වාර්ෂිකව ඉදිරිපත් කල යුතු වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි. | වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කරන ලෙස දෙපාර්තමේන්තුවේ අදාළ නිලධාරීන් වෙත සෑම වර්ෂයකම පළමු කාර්තුවේදී ලිඛිතව දැනුම් දීම සිදු කරනු ලබන අතර 2022 වර්ෂය සඳහා ද එලෙසම දැනුවත් කිරීම සිදු කර ඇති අතර නිලධාරීන් 48 දෙනෙකු විසින් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර ඇත. | වත්කම් හා බැරකම් ප්‍රකාශ නියමිත දිනට ඉදිරිපත් කිරීමට කටයුතු නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග ගතයුතු වීම. |

**6. මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ සුදුසුකම පමණක් ඇති කාලගුණ විද්‍යාඥයින් 5 දෙනෙක් පමණක් සේවයේ නියුතුව සිටින බව නිරීක්ෂණය විය. ඒ අනුව අහිතකර කාලගුණික තත්වයකදී කාර්යක්ෂමව නිවැරදි අනාවැකි නිකුත් කිරීමට ප්‍රමාණවත් පුහුණුවක් කාලගුණික විද්‍යාඥයින්ට ලැබී නොමැති බව නිරීක්ෂණය විය. | අ.පො.ස (සා. පෙල) හා අ.පො.ස. (උ.පෙල) සුදුසුකම් ඇතිව උසස්වීම් ලබා ඇති කාලගුණ විද්‍යාඥයන් 05 දෙනෙකු මේ වන විට සිටින අතර, එම පස්දෙනා ඔවුන්ගේ මූලික සුදුසුකම් අනුව පශ්චාත් උපාධිය සඳහා යොමු කළ නොහැක. ඒ අනුව වර්තමානයේ පුහුණුව හා පශ්චාත් උපාධි සුදුසුකම් ලබා ගත යුතු නිලධාරීන් හට එම අවස්ථාවන් උපරිම වශයෙන් ලබා දී ඇත. | දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ විෂය සම්බන්ධයෙන් පවතින අධ්‍යාපනික දැනුම ඉහළ නැංවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | දෙපාර්තමේන්තුව සඳහා 2021 වර්ෂයට අදාලව මානව සංවර්ධන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | 2023 වර්ෂයට පිළියෙළ කිරීම ආරම්භ කර ඇත. එමඟින් ඉදිරියේදී සෑම නිලධාරියෙකුම ඇතුළත් වන පරිදි මානව සම්පත් සැලැස්ම පිළියෙළ කර කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය වැඩි දියුණු කර ගැනීමට බලාපොරොත්තු වේ. | මානව සම්පත් සැලැස්මක් සකස් කළ යුතුය. |